මාධ්‍ය නිවේදනය

# මැතිවරණ කොමිෂන් සභාව

**2020.12.31 දින රැස්වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

- නව දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමේ කටයුතු 2021 ජනවාරි මාසයේ දී ආරම්භ කරනු ලබන අතර ඊට අවශ්‍ය නිර්ණායක සකස් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට තීරණය කරන ලදී. එම කමිටුවේ නිර්දේශ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු එකී නිර්ණායක අදාළ පාර්ශ්වවල දැන ගැනීම සඳහා ගැසට් පත්‍රයක් මගින් ප්‍රසිද්ධියට පත් කරනු ඇත.

- රට තුළ ව්‍යාප්ත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමට සිදුවීම නිසා එම මැතිවරණයේ දී අපේක්ෂකයන් ලෙස තරග කිරීමට ඉදිරිපත් වූ රජයේ නිලධාරීන්ට මුළු මැතිවරණ කාල සීමාව තුළම වැටුප් රහිතව සිටීමට සිදු වූයේ ඔවුන්ගේ පාලනයෙන් බැහැර කාර්යයක් වීම හේතු කොට ගෙන බැවින් හා ඔවුනට එයින් අහිතකර බලපෑමක් ඇතිවී ඇති බවට පැමිණිලි කර ඇති හෙයින් එම කාල සීමාව සඳහා වැටුප් ගෙවීමට අවශ්‍ය සුදුසු පියවර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැන්වීම.

- කොමිෂන් සභාවේ එක් එක් සාමාජිකයා වෙත කොමිෂන් සභාවේ පවතින කාර්යභාරය හා ඊට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඒ ඒ කාර්යයන්වල නිශ්චිත වගකීම හා අධීක්ෂණය පැවරීම.

- කොමිෂන් සභාවේ කාර්යභාරය පිළිබඳව පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම හා ඒ අනුව විධිමත් කිරීම සඳහා ඒ පිළිබඳව විශේෂඥ දැනුමැති ආයතනයක් වෙත පවරා සම්පූර්ණ වාර්තාවක් කෙටි කාලයක් තුළ ලබා ගැනීම හා ඒ අනුව අවශ්‍ය ව්‍යුහාත්මක සංශෝධන සිදු කිරීම.

- පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගේ රැස්වීමක් 2021.01.11 දින පෙ.ව 10.00 ට පැවැත්වීම.

- මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නිලධාරීන්ගේ රැස්වීමක් 2021.01.11 දින ප.ව 02.30 ට පැවැත්වීම.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2020.12.31